## ශ්‍රී ලංකා
## ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
## පාර්ලිමේන්තුව

---

# 1992 අංක 18 දරන රත්මලාන ඓතිහාසික ගොනාබැද්ද කතරගම මහා දේවාල භාරකාර මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 25 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 මාර්තු මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

**1992 අංක 18 දරන රත්මලාන ඓතිහාසික ගොනාබැදි කතරගම මහා දේවාල භාරකාර මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 1992 මාර්තු මස 25 වන දින]

එල්. ඩී.—ඕ. 60/90

**රත්මලාන ඓතිහාසික ගොනාබැදි කතරගම මහා දේවාල භාරකාර මණ්ඩලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"රත්මලාන ඓතිහාසික ගොනාබැදි කතරගම මහා දේවාල භාරකාර මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන මණ්ඩලයක්, එකී මණ්ඩලයේ සාමාජිකයින් එකඟ වූ රීති අනුව එකී මණ්ඩලයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා වර්ෂ එක්දහස් නවසිය අසූහතේ දී රත්මලාන, ජයසුමනාරාම පාරේ අංක 51 දරන ස්ථානයේදී පිහිටුවා මෙතෙක් කල් පවත්වා ගෙන ගොස් ඇති හෙයින් ද:

එකී භාරකාර මණ්ඩලය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාර්ය යන් සඳහා ද ඒ පරමාර්ථ හා කාර්යයන් වඩා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට එකී මණ්ඩලයට හැකිවනු පිණිස එකී භාරකාර මණ්ඩලය සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1992 අංක 18 දරන රත්මලාන ඓතිහාසික ගොනාබැදි කතරගම මහා දේවාල භාරකාර මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

රත්මලාන ඓතිහාසික ගොනාබැදි කතරගම මහා දේවාල භාරකාර මණ්ඩලය සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට හා ඉන්පසු (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) රත්මලාන ඓතිහාසික ගොනාබැදි කතරගම මහා දේවාල භාරකාර මණ්ඩලයේ දැනට සාමාජිකයන්ව සිටිනනාන් තැනැත්තන් හා මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු සාමාජිකයින් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු 'සංස්ථාව' යනුවෙන් සඳහන් කරනු ලබන) "රත්මලාන ඓතිහාසික ගොනාබැදි කතරගම මහා දේවාල භාරකාර මණ්ඩලය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත්වන අතර, ඒ නාමයෙන් සියලු අධිකරණවල එය විසින් ද එයට විරුද්ධවද නඩු පවරනු ලැබිය හැකි ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, පාවිච්චි කිරීමේ සහ ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) වාර්ෂික ගිනිමඩු පූජා උත්සවයට සම්බන්ධ පිළිවෙත්, සම්ප්‍රදායන්, චාරිත්‍ර විධි සහ ආගමික පුදපූජා දිගටම පැවැත්වීම සහ මහා දේවදානය පිරිනැමීම සහ ඒවාට සම්බන්ධ වෙනත් සියලු වතාවත් දිගටම පවත්වාගෙන යාම ;

(ආ) බෞද්ධ සම්ප්‍රදායන්ට අනුකූලව සහ චිරාගත සම්ප්‍රදායන්ට අනුකූලව දේවාලයේ වාර්ෂික ඇසළ පෙරහැර පවත්වා ගෙන යාම;

(ඇ) දේවාලයේ වාර්ෂික ගිනි පෑගීමේ උත්සවය සහ පිරිත් පිංකම සංවිධානය කිරීම ;

(ඈ) මහා දේවාලය සතු සියලු ගොඩනැගිලි නඩත්තු කිරීම, අවශ්‍ය වන විට නව ගොඩනැගිලි ඉදිකිරීම සහ දේවාල ඉඩම් සංවර්ධනය කිරීම සඳහා කාර්ය සාධන ලෙස කටයුතු කිරීම ;

(ඉ) දේවාලය භාරයේ පවතින සහ දේවාලයට සතු කොට දී ඇති පුරා විද්‍යාත්මක වැදගත්කමකින් යුත් සියලු දේ ආරක්ෂා කිරීම සඳහා කටයුතු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් හා පරිත්‍යාගයන් ලබාගැනීමේ සහ එකතු කිරීමේ ද සිය අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිලධාරීන් සහ සේවකයන් සේවයට ගැනීමේ සේවයේ නියුක්ත කර ගැනීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුලුව සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඒ පරමාර්ථ අතුරින් යම් කිසිවක් වැඩිදියුණු කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන සියලු ක්‍රියා, කාරණා සහ දේවල් සිදු කිරීමේ, ඉටු කිරීමේ සහ කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

භාරකාර මණ්ඩලයේ සංයුතිය.

**5.** (1) සංස්ථාවේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය සංස්ථාවේ තත්කාලයේ වලංගුව බලපවත්නා රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ ද ඒ [illegible]ලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන්නා වූ ද සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික ඇතුළු සාමාජිකයන් දහහත් දෙනෙකුගෙන් සමන්විත වූ භාරකාර මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ කුමක් සඳහන් වී තිබුණද, එම්. ගාමිණී ආර්. ප්‍රනාන්දු මහතා දේවාලයේ ප්‍රධාන භාරකරු සහ භාරකාර මණ්ඩලයේ භාණ්ඩාගාරිකවරයා විය යුතු අතර, ඔහු යාවජීව වශයෙන් ඒ ධුරය දැරිය යුතු ය. ඔහුගේ මරණය නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ ඒ ධුර පුරප්පාඩු වුවහොත් සංස්

ථාවේ රීතිවලට පටහැනිව කුමක් සඳහන්ව තිබුණද ඔහුගේ වැඩිමහල් පුත්‍රයා විසින් හෝ ඔහු අශක්නුතාවකට පත් වුවහොත් ඔහුගේ වැඩිමහල් සහෝදරයා විසින් යන වශයෙන් පියපාර්ශ්ව අනුප්‍රාප්තිය අනුව ඒ පුරප්පාඩු පුරවනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී ධුර දැරූ මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

(4) භාරකාර මණ්ඩලයේ රැස්වීමක ගණපූරණය සාමාජිකයන් සිව් දෙනෙකුගෙන් යුක්ත වන්නේ ය.

දේවාල සංවර්ධන අරමුදල.

**6.** දේවාල සංවර්ධන අරමුදල—

(අ) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවීමට පෙරාතුව ම වූ දිනයේ දී දේවාලයේ සංවර්ධන අරමුදලේ බැරට ඇවති සියලු මුදල් වලින් ; සහ

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයෙන් පසු අරමුදලට එකතුවන මුදල්වලින්

සමන්විත වන්නේ ය.

සංස්ථාවේ රීති.

**7.** (1) භාරකාර මණ්ඩලය විසින් කලින් කල මණ්ඩලයේ යම් මහා සභා රැස්වීමකදී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයින්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත සඳහන් කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් සාදනු ලැබිය හැකි ය :—

(අ) භාරකාර මණ්ඩලයේ රැස්වීම්වල කටයුතු කිරීමේදී අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය ;

(ආ) භාරකාර මණ්ඩලයේ සාමාජිකයන්ගේ සහ සංස්ථාවේ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, හැසිරීම, කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා භාරකාර මණ්ඩලය විසින් දරනු ලබන වියදම් පියවීම ;

(ඈ) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ සාක්ෂාත්කර ගැනීම ;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම, එහි අරමුදල්වල භාරකාරත්වය සහ එහි ගිණුම් පවත්වාගෙන යාම සහ ඒවා විගණනය කිරීම ;

(ඊ) සංස්ථාවේ ගිණුම් තැබීම, මුදල් තැන්පත් කිරීම සහ ලේඛනවල භාරකාරත්වය ; සහ

(උ) සංස්ථාවේ පරමාර්ථවලට අදාළ වන හෝ ආනුෂංගික වන වෙනත් යම් කරුණක්.

(2) එවැනි රීති සෑදීමෙන් පසු ඒවා එවැනිම රැස්වීමකදී, එවැනිම ආකාරයෙන් වෙනස් කිරීම, ඒවාට අලුතින් යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ සාමාජිකයන් තත්කාලයේ සංස්ථාවේ බල පවත්නා රීතිවලට යටත් විය යුත්තා හ.

(4) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේදී මණ්ඩලයේ පැවති රීති, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට මේ වගන්තිය යටතේ සාදනු ලැබූ රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් ඒවා වෙනස් කිරීම, සංශෝධනය කිරීම, ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

භාරකාර මණ්ඩලය විසින් ගෙවිය යුතු සහ ඊට අයවිය යුතු ණය.

8. මේ පනතේ කාර්යයන් සඳහා, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේදී පැවති මණ්ඩලයේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට මණ්ඩලයට අයවිය යුතු සියලු ණය හා මණ්ඩලය වෙත ගෙවිය යුතු සියලු සම්මාදම් මුදල් හා දායක මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

9. යම් මිලයට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන් ආකාරයකින් සංස්ථාව සතු වන්නා වූ චංචල හෝ නිශ්චල කවර දේපළක් වුව ද භාර ගැනීමටත් දැරීමටත් නීතිය අනුව හැකියාව සහ බලය සංස්ථාවට ඇත්තේ ය. තවද ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හෝ අන් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව සංස්ථාවේ රීතිවලට යටත්ව මේ පනතේ කාර්යයන් සඳහා එකී සියලු දේපළ සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

10. සභාපතිවරයා ද ලේකම් හෝ භාණ්ඩාගාරික යන දෙදෙනාගෙන් එක් අයකු ද ඉදිරිපිටදී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවන් වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

11. මේ පනතෙහි සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නන් හැර ශ්‍රී ලංකා ජනරජයේ, යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

12. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.